


"ගී සඳැළුවෙන්" අපි හැමදාම ගීතයක පසුබිම ගැන කතාකරනවා. ඒ ගීතවල නිර්මාතෘවරුන් ගැන කතා කරනවා. නමුත් ඒ නිර්මාතෘවරුන් නිර්මාණය කළ නිර්මාතෘ, ආයතන ගැන කතා කරනවා අඩුයි. මේ වාරයේ අපගේ ලිපිය ඒ වාගේ සද්කාරියකට යොමුකරවන්නය අපගේ අදහස.

මේ වසරේ දී 124 වන සංවත්සරය සමරන කොළඹ ආනන්ද විද්‍යාලය ඒ වෙනුවෙන් තෝරාගැනීමට හේතු ගණනාවක්ම තිබෙනවා. සෑම නොවැම්බර් පළවෙනිදාම කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා ප්‍රමුඛ තමන්ගේ ආදී කතෘවරුන් සිහිපත් කරමින් විද්‍යාලයේ පැවැත්වෙන මහා පුණ්‍යෝත්සවයට සමගාමීව වික්ටෝරියානු ආදී ආනන්දයීයන්ගේ සංගමය සංවිධානය කරන්නාවු පින්කම නොවැම්බර් 21 දා කිස්බරෝහි ධම්මසරණ විහාරස්ථානයේදී පැවැත්වීමට නියමිතයි. ඒ පිළිබඳව අප සමඟ මෙහි ජීවත්වන සෑම ආනන්දයීයෙකුටම සිහිපත් කිරීම මුලික අරමුණයි.

ගී සඳැළුව වෙනුවෙන් -ආනන්දේ හඬ ආනන්දයි! ගීය තෝරාගැනීමට මුල් වු හේතුව වන්නේ එය මව් බිමේ මෙන්ම දේශ දේශාන්තරවල සිටින සියළු ආදී ආනන්දීයන් මෙන්ම ආනන්දයීය සිසුන් සියළු දෙනා හොඳින්ම දන්නා විද්‍යාලය වෙනුවෙන් නිර්මාණය වු ගීයක් වීමයි. දිනපතාම පාසැල නිමාවන්නේ මෙම ගීතය ගායනය හා වාදනය කිරීමෙන්. ඒ නිසාම මේ පදවැල ඒ හැමෝගෙම මතකයේ රැඳුන, ඒ අය අතර ප්‍රචලිත ගීයක්. මේ පිළිබඳව කතාකරන්නට අපි මව්බිමේ වෙසෙන විශාරද අනිල් මිහිරිපැන්න සංගීතවේදියාණන් සම්බන්ධ කරගත්තේ ගීයේ තනු නිර්මාපකයා එතුමන් වු නිසයි.

පුදුමයක් නෙමෙයි.

ආදී ආනන්දයීය හර්ෂ බණ්ඩාර ජයලත් සොහොයුරාගේ මෙහෙයවීම, පුහුණුව යටතේ මෙල්බර්න් නුවර ගැයෙන ආනන්දයීයන්ගේ වෙසක් භක්ති ගීත ගායනා මේ වසරේ ඇරඹුණේ - මල් මල් බඳුන් රැගෙන " කියන භක්ති ගීතයෙන්. තුරංගා වන්නමේ තනුවට අනුව මිහිරිපැන්න ගුරුතුමා කළ මේ ගීතයේ පද මෙහි ගායනයට සුදුසු විදියට සකස් කරන්නට අපට අවස්ථාව ලැබුණා.

මේ සියල්ලටම වඩා වැදගත් වන -දින දින කිතුගොස" ආනන්දයේ පාසැල් ගීතය රචනා කළේ එවකට විද්‍යාලයීය ආචාර්ය මණ්ඩලයේ භූගෝලය විෂයය ඉගැන්වීම කළ එම්. ඊ. ප්‍රනාන්දු ආචාර්යවරයායි. මිහිරිපැන්න ගුරුතුමා පවසන අන්දමට තනුව නිර්මාණය වෙලා තියෙන්නෙ උත්තර භාරතීය රාගධාරී සංගීතයේ එන -දුර්ගා" රාගය ආශ්‍රය කරගෙන. ඒත් තනුව නිර්මාණය කළේ කවුරුන්ද යන්න සොයාගැනීමට අපි අපොහොසත් වුණා. ඒ පිළිබඳව සමාව අයැදිනවා.

# ආනන්දේ හඬ ආනන්දයි!

"ආනන්දයේ බුදු මැදුර ඉදිකරලා ඉවරවුනෙ කර්නල් ජී. ඩබ්ලිව්. රාජපක්ෂ මහත්මයා විදුහල්පති වෙලා හිටපු කාලෙ. තමන්ගේ හිතේ තියෙන දේ අපේ දෙයක් විදියට එළියට ගන්න එතුමා හරි දක්ෂයා." මිහිරිපැන්න ගුරුතුමා සාකච්ඡාවට හවුල් වුණා.

-ඉතින් බුදුමැදුර විවෘත කරන වෙලාවෙ අපිට මොනවද කරන්න පුළුවන් කියලා අහපු ප්‍රශ්ණයට උත්තරය වුණේ" භක්ති ගීත කීපයක් හදමු" කියන එකයි. එත් විදුහල්පතිතුමාට ඕන වුණා ආනන්දය ගැනත් කියවෙන බුදුමැදුර ගැනත් කියවෙන ගීතයකුත් කරන්න. ඒ අදහසට තමයි -ආනන්දයි" ගීතය ලියවුණේ. ඒ දවස් වල අපිත් එක්ක ගුරුමණ්ඩලයේ හිටපු සරත් විමලවීර මහත්මයා තමයි පද රචනාව කළේ. මම ඉතින් ස්වතන්ත්‍ර නිර්මාණයක් විදියට තනුවත් සංගීතයත් නිර්මාණය කළා." මිහිරිපැන්න ගුරුතුමා ඒ අත්දැකීම විස්තර කළා.

බුදු මැදුර විවෘත කළ දා පටන් ආනන්දයේ  දිනපතා උදයේ කෙරෙන වත් පිළිවෙත් ටිකක් තියෙනවා.  රාජපක්ෂ විදුහල්පතිතුමාගේ ඉල්ලීමට මිහිරිපැන්න ගුරුතුමා නිර්මාණය කරපු භක්ති ගීත ශිෂ්‍යන් ගායනය, වාදනය කරන අතරේදී විද්‍යාලයේ ඒ ඒ අංශවලින් මල් වට්ටි රැගත් ශිෂ්‍යයන් පේළි ගැසී විහාරයට එනවා. ඒ ඒ දවසට රැස්වීමට නියමිත ශිෂ්‍යයන් පේළි සැදී රැස්වීම් බිමේ ඉන්න අතරේ අනික් ළමයි හැමෝම පන්තිවලින් පිටතට ඇවිත් ඒ ඉදිරිපිට පේළි සැදී බුදුන් වඳින්නට සුදානම් වෙලා ඉන්නවා. මල් පූජාවට මල් වට්ටි අරගෙන යන ශිෂ්‍යයින් විහාරයට ළඟාවන කොටම විද්‍යාලයීය හේවිසි තූර්ය වාදක කණ්ඩායම තම්මැට්ටම්, දවුල්, ගැටබෙර වාදනය කරමින් තේවාව වාදනය කරනවා. තම්මැට්ටම් සුරලයකින් ඇරඹී සුරලයකින්ම අවසන් වන තේවාවෙන් පස්සේ අචාර්ය මණ්ඩලයේ ගරුතර ස්වාමීන් වහන්සේ නමක් ශිෂ්‍යයන්ව පන්සිල් සමාදන් කරවනවා. තූර්ය වාදක කණ්ඩායම වාදනය කරන තේමා වාදනයකින් පස්සේ පාසැල් ප්‍රවෘත්ති සිංහලෙන්, ඉංග්‍රීසියෙන් විකාශනය කරනවා. ඊට පස්සේ පාසැල් ගීයයි ජාතික ගීයයි ගායනයත්, වාදනයත් කරමින් පොදු වත් පිළිවෙත් නිමා කරනවා. මේ හැම දෙයක්ම කරන්නේ ශබ්ද විකාශන මාර්ගයෙන් මුලු පාසැලටම ඇහෙන විදියට. දිනපතා ශිෂ්‍යයින් 7000 - 8000 ක් එකම වෙලාවෙ එකම විදියට මේ වතාවත් වල යෙදෙන්න විනය ගරුක වෙනවා.

විහාරයට මල් පුදන්න ගිය සිසුන-"ට ගාථා කියවලා කෙටි අනුශාසනාවක් ගරුතර ස්වාමීන්වහන්සේ නමක් විසින් විහාරය තුළදීම කරනවා. රැස්වීමට එක්වෙලා සිටින ශිෂ්‍යයින්ට නොයෙකුත් ගිහි - පැවිදි අනුශාසනා වෙනමම රැස්වීම් බිමේදී ම කෙරෙනවා. සෑම පන්තියකටම සතියකට වරක් රැස්වීමටත්, මාසයකට වරක් පමණ මල් පූජාවටත් සහභාගී වෙන්න පුළුවන් වෙන්නයි සැළසුම් කරලා තියෙන්නෙ.

විවේක කාලය අවසානයේදීත්, පාසැල අවසානයේදීත් පාසැල වෙනුවෙන්ම නිර්මාණය වුණ ගීත ගායනය, වාදනය වෙනවා. විශේෂයෙන්ම පාසැල අවසානයේදී වාදනය වන එකම ගීතයයි - ආන්නදේ හඬ ආනන්දයි!" ගීතය. අප පාසැල් යන කාලයේ පැවැත්වු වතාවන් දැන් වඩාත් දියුණු තාක්ෂණික ක්‍රම යොදාගෙන කරනවා. මේ වතාවත් නිසාවෙන් වෙනමම විනයක්, සහෝදර බැඳීමක්, පාසැලට ලෙන්ගතුකමක් ඇතිවෙන එක

**ආනන්දයි - ආනන්දයි**
**ආනන්දේ හඬ ආනන්දයි**

**සිල්ගත් තනි සුදු නෙළුම් කුසුම් ලෙස**
**පැහැදී පිබිදී පිරිසිදු වී**
**මුණිදුන් නම දී අත් යුග හිස දී**

**සම්මා සමුබුදු සුගත තථාගත**
**සම්බුදු පිළිමය අබියස දී**
**කෙළෙසුන් දුරුවී පින් සිත් පිබිදී**

ඒ උත්සාහය ඉදිරියටත් ගෙනයනවා.

මෙවර ගී සඳැළුවේ -ආනන්දය" සම්බන්ධව සටහන් තියන්නට අදහස් කළ අනික් ප්‍රධාන කාරණය වන්නේ ශ්‍රී ලාංකේය ගීත කෂේස්ත්‍රයට ආදී ආනන්දීයයන් ගෙන් ලැබී ඇති දායකත්වයයි.

මහාචාර්ය ජේ. බී. දිසානායකයන්ගෙන් ඇරඹෙන ආදී ආනන්දයීය ගේය පද රචක පරපුර, ඩෝල්ටන් අල්විස්, දයානන්ද ගුණවර්ධන, විමල්



අබේසුන්දර, බණ්ඩාර කේ. විජේතුංග, සුනන්ද මහේන්ද්‍ර, ප්‍රේමකීර්ති ද අල්විස්, කුලරත්න ආරියවංශ, මහාචාර්ය ප්‍රණීත් අබේසුන්දර, ආනන්ද පද්මසිරි වැනි ප්‍රවීණ හා ජනප්‍රිය පිරිසකින් සමන්විතයි. ඒ අතරට මේ ලිපිය සම්පාදනය කරන අපටද එක්වන්නට ලැබීම වාසනාවක්.

ආදී ආනන්දයීය ගායන ශිල්පීන් අතරට රෝහණ සිරිවර්ධන, මොරිස් දහනායක, කසුන් කල්හාර, භාතිය, ජගත් වික්‍රමසිංහ, මධු මාධව අරවින්ද, ජනනාත් වරකාගොඩ, සහන් රන්වල යන ශිල්පීන් වගේම ආදී ආනන්දයීය සංගීතවේදීන් අතරට විශාරද රෝහණ ධර්මකීර්ති සංගීතවේදියාත් අයත් වෙනවා.

මෙල්බර්න් නුවර අප අතරේ වෙසෙන ආදී ආනන්දයීයන් අතරින් හේමන්ත ඩයස් සහ රුක්මන් විමලසුරිය ද වේදිකාවේ ගායනයන් ඉදිරිපත් කරනවා.

මේ ආකාරයෙන් සලකනකොට ආදී කතෘන් සිහිපත් කරන මේ නොවැම්බර් ගී සඳැළුව -ආනන්දේ හඬ ආනන්දයි" ගීතයට වෙන්කිරීම සුදුසුයි කියලයි අපි හිතන්නෙ.

මෙම ලිපියට ඇතැම් කරුණු රැස් කර ගන්න උදව් දුන්න අනිල් මිහිරිපැන්න ගුරුතුමාටත්, ගීතදේව මිහිරිපැන්න සොහොයුරාටත් ස්තුතිවන්ත වෙනවා. කර්නල් ජී. ඩබ්ලිව්. රාජපක්ෂ විදුහල්පති තුමා හැමෝටම ආශිර්වාද කළේ ආනන්දයටද අවේණික වුණ පැතුමකින්.

"ඔබට ආනන්දයේ සරණයි !"